*සැ. යු.* — මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2013 වර්ෂයට අදාළ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්ගේ නාමාවලිය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පළවේ. .

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,888 - 2014 නොවැම්බර් මස 07 වැනි සිකුරාදා - 2014.11.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1466 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත 2014 ඔක්තෝබර් මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 නොවැම්බර් මස 28 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 නොවැම්බර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1465- B 80890— 2,875 (2014/11)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි කෘෂිකර්ම උපදේශක /සත්ව සංවර්ධන උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීම - 2014(2)

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ සහ සත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියේ තනතුරුවල පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මධ්‍යම පළාත තුළ පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී/ පුරුෂ දෙපාර්ශවයෙන්ම අයැදුම්පත් කැඳවනු ලැබේ.

1. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු යි.

2. *වෙනත් සුදුසුකම් :*

2.1. අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට (2014.11.25 දින) පූර්වාසන්නයෙන් වූ වසර 03 ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. (අයැදුම්කරු මෙම පළාතේ වසර 03ට වඩා ස්ථිර පදිංචි අයෙකු සමග විවාහ වූ විට කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සළකා බැලේ.)

2.2. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

2.3. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

2.4. තනතුරුවලට බඳවා ගැනීමට අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට මෙම නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. *වයස :*

3.1. අවම සීමාව : අවු. 18 ට නොඅඩු
3.2. උපරිම සීමාව : අවු. 30 ට නොවැඩි (මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු වුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ)

4. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|
| | *අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම්* | *අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම්* | |
| කෘෂිකර්ම උපදේශක | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයකින් (06) එකවර සමත්ව තිබීම. | ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයන් දෙකක් සහිතව විද්‍යා විෂය ධාරාවන් යටතේ සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර) එකවර සමත්ව තිබීම /පැරණි විෂය නිර්දේශය යටතේ මෙහි සඳහන් විෂයන් දෙකක් සහිතව විෂයන් 03කින් එකවර සමත්ව තිබීම. | 1. කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස, පැල්වැහැර, බිබිල, ලබුදූව, වාරියපොළ, වව්නියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,<br>*හෝ*<br>2. හාඩි කාර්මික ආයතනයෙන් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,<br>*හෝ*<br>3. ඇක්වයිනාස් විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,<br>*හෝ*<br>4. රජය විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. |

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| | අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම් | අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම් | |
| සත්ව සංවර්ධන උපදේශක | ඉහත පරිදි වේ. | ඉහත පරිදි වේ. | 1. වැලිසර ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය ;<br>හෝ<br>2. අනුරාධපුර/සීප්පුකුලම සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය නිකුත් කරනු ලබන දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය ;<br>හෝ<br>3. කරඳගොල්ල ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය. |

5. *වැටුප් පරිමාණය :*

5.1. මෙම තනතුරුවලට හිමි වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (IV) හි MN 3-2006 (A) වේ.

රු. 15,005 - 4 x 180 -6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885

6. *බඳවා ගැනීමේ කොන්දේසි.-* මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටි අනුව බඳවා ගැනීමේ කොන්දේසි තීරණය වේ.

7. *බඳවා ගැනීමේ ක්‍රමය.-* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන පරිදි දිස්ත්‍රික් ජනගහන අනුපාතය අනුව ඉහත පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. මේ සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාවය මත සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සුදුස්සන් තෝරා ගැනේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර ලිඛිත විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40%ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා අයැදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සලකා බලනු නොලැබේ.

8. *සේවා කොන්දේසි :*

8.1. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

8.2. පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත්කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධානවලට යටත් වේ.

8.3. මෙම තනතුරුවලට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05 ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

9. *අයැදුම් කිරීමේ ක්‍රමය :*

9.1. විභාග ගාස්තුව රු.600 කි. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන පරිදි මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ඒ සඳහා ලබාගත් ලදුපතක් අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එකී ලදුපත නොමැතිව එවන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන බව ද සැලකිය යුතුය.

9.2. අයැදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට 2014.11.25 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, තැ.පෙ. 114, අංක 244, කටුගස්තොට පාර, මහනුවර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයැදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයැදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම උපදේශක/සත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම - 2014 (2)" යනුවෙන් සහ පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයැදුම්පත් හා අසම්පූර්ණ අයැදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයැදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

10. *විභාග මාධ්‍යය.-* විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයැදුම්පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයට නියමිත අක්ෂරය පැහැදිලිව සඳහන් කළ යුතු අතර එය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

11. *විභාග මධ්‍යස්ථානය.-* විභාග මධ්‍යස්ථානය පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයැදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ.

12. *විභාග විෂය නිර්දේශය*.- මෙම තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්කරුවන් පහත සඳහන් විෂයයන් යටතේ ලිඛිත විභාගයකට යොමු කරනු ලැබේ.

1. බුද්ධි පරීක්ෂණය

කාලය පැය 01 යි. (ලකුණු 100) මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත ය.

2. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය

කාලය පැය 02 යි. (ලකුණු 100) තනතුරුවලට අදාළව තාක්ෂණික දැනුම මැන බැලෙන බහුවරණ හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.

13. *අයදුම්පත් පිරවීම සඳහා උපදෙස්*.- ආදර්ශ අයදුම්පත් ආකෘතියට ප්‍රකාර ඒ 4 ප්‍රමාණයක කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-5 දක්වා කරුණු ද අනෙක් පිටුවල ඉතිරි ඡේදද ඇතුළත්වන සේ සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රය පිරවීමේදී පහත දැක්වෙන සංකේත අංක නියමිත කොටුවල පැහැදිලිව සඳහන් කළ යුතු ය.

13.1. අයදුම් කරන දිස්ත්‍රික්කය ලෙස සඳහන් කල යුත්තේ අයදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකයයි.

| | | |
|---|---|---|
| මහනුවර | - | 01 |
| මාතලේ | - | 02 |
| නුවරඑළිය | - | 03 |

13.2. තනතුර සඳහා වෙන් කර ඇති සංකේත අංකය :

| | |
|---|---|
| කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණිය | 01 |
| සත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය | 02 |

13.3. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රු 240360/- කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිළධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

13.4. යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත්කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

13.5. රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතුය.

14. මෙම විභාග පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම/තීරණය කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

ආර්.එම්.එන්. රත්නායක,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2014 ඔක්තෝබර් මස 20 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි කෘෂිකර්ම උපදේශක/සත්ව සංවර්ධන උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීම - 2014(2)**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐
සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E
(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න)

විභාග අංකය : ☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

තනතුර : ☐

තනතුරට අදාළ සංකේත අංකය : ☐

පදිංචි දිස්ත්‍රික්කය : ☐

දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකය : ☐

---

1. අයදුම්කරුගේ :

1.1. මුලකුරු සමඟ නම :..........................................................................................
(Mr/Mrs/Miss) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2. මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) :.................................................................. මයා/මිය/මෙනවිය

1.3. මුල' කුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :.............................................................................................................

1.4. මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :.............................................................................................................

2. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :.............................................................................................................

2.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :.............................................................................................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :.............................................................................................................

2.4 දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් කාර්යාලයීය ලිපිනය :.............................................................................................................

2.5 දුරකථන අංකය :.............................................................................................................

3. 3.1 උපන් දිනය :.............................................................................................................

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2014.11.25) වයස : අවු. :.................. මාස :................. දින :....................

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

4. ස්ත්‍රී/පුරුෂ භාවය :.................................................................

5. 5.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :.............................................................................................................

| *ඡන්ද හිමි නාම ලේඛනයට අනුව පදිංචිය* | *2011* | *2012* | *2013* |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

6. *අධ්‍යාපන සුදුසුකම් :*

6.1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය :

වසර :..................................... විභාග අංකය :..............................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

6.2 අ.පො.ස. (උසස් පෙළ) විභාගය ඃ

වසර ඃ.................................... විභාග අංකය ඃ..............................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

7. *වෘත්තීය සුදුසුකම් ඃ*

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |

8. *වෙනත් සුදුසුකම් ඃ* ..........................................................................................................................................................................................................

9. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු.-

(i) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම ඃ.....................................................................................................
(ii) දිනය ඃ...............................................................................................
(iii) කුවිතාන්සි අංකය ඃ......................................................................

| (මුදල් ගෙවා ලබාගත් ලදුපත මෙම තීරුව අසලින් අලවන්න) |
|---|

***අයදුම්කරුගේ ප්‍රකාශය***

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත් පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි.

............................................ ....................................................
දිනය අයදුම්කරුගේ අත්සන.

***අයදුම්කරුගේ අත්සන සහතික කිරීම***

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..........................................................මහතා/මහත්මිය/මෙනවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

.......................................... ...............................................................
දිනය සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම ඃ....................................................................
තනතුර ඃ...................................................................................................................
ලිපිනය ඃ..................................................................................................................

10. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.

මෙම ඉල්ලුම්කරු වන..........................................................මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.......................................................... වශයෙන් සේවය කරයි. පසුගිය වසර 05 තුළ ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

............................................
දිනය

....................................................................
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

11-108

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| *අති විශෙෂ ගැසට් පත්‍රය* ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2014 වර්ෂය** | | | | | |
| නොවැම්බර් | 2014.11.07 | සිකුරාදා | 2014.10.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.11.14 | සිකුරාදා | 2014.10.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.11.21 | සිකුරාදා | 2014.11.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.11.28 | සිකුරාදා | 2014.11.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2014.12.05 | සිකුරාදා | 2014.11.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.12 | සිකුරාදා | 2014.11.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.19 | සිකුරාදා | 2014.12.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.26 | සිකුරාදා | 2014.12.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| | **2015 වර්ෂය** | | | | | |
| ජනවාරි | 2015.01.02 | සිකුරාදා | 2014.12.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.09 | සිකුරාදා | 2014.12.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.16 | සිකුරාදා | 2015.01.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.23 | සිකුරාදා | 2015.01.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.30 | සිකුරාදා | 2015.01.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.